## 1.5 පැමිණිලි සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය

මෙම කාර්යාලය වෙත ලැබෙන සෑම පැමිණිල්ලක්ම/පෙත්සමක්ම වෙනම ලේඛනයකට ඇතුලත් කරනු ලබන අතර, ඉන් අනතුරුව එම පැමිණිල්ල සඳහා විශේෂිත අංකයක් දෙනු ලබයි. ඉන්පසු මෙම පැමිණිලි, විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්,  වැටුප් විෂමතා, වැටුප් වර්ධක, උසස්වීම්, ඉඩම්, අනවසර ඉදිකිරීම්, සේවය අවසන් කිරීම්, තනතුරෙහි නැවත පිහිටුවීම්, සේවා අන්තර්ග්‍රහණය කිරීම්, විශ්ව විද්‍යාල/පාසල් වලට ඇතුලත් කිරීම් හා බලය අනිසි ලෙස භාවිතා කිරීම් ආදිය ලෙස විෂයයන් අනුව වර්ගීකරණය කරනු ලැබේ. මෙම කාර්යාලයේ නිලධාරීන් වෙත පවරා ඇති සහ ඔවුන් විසින් කටයුතු කරන විශේෂිත විෂයයන් මේවා වන අතර, එම නිලධාරීන් රාජ්‍ය සේවයේ "කළමනාකරණ සේවා නිලධාරීන්" යන කාණ්ඩයට අයත් වේ. පැමිණිල්ලක් ලියාපදිංචි කිරීමෙන් පසුව එය අදාල කළමනාකරණ සේවා නිලධාරියා (විෂයභාර ලිපිකරු) වෙත යොමු කරනු ලබන අතර, ඉන් අනතුරුව එක් එක් පැමිණිල්ල සඳහා ලිපිගොනුවක් විවෘත කිරීම ඔවුන් සතු කාර්යයක් වේ. මෙම විෂය ප්‍රස්තුතය තෝරා ගැනීම සිදු කරනු ලබන්නේ කාර්යාලයේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිනිය විසිනි.

යම් පැමිණිල්ලකට අදාලව ලිපිගොනුවක් විවෘත කළ විට එම පැමිණිල්ලේ අන්තර්ගත කරුණු සාරාංශගත කරමින් අදාල විෂයභාර ලිපිකරු විසින් ලිපිගොනුවෙහි ජර්නල් සටහනක් යොදනු ලබයි. ඉන් පසු ඔහු/ඇය විසින් පරිපාලන නිලධාරිනිය සමග පැමිණිල්ලේ ස්වභාවය පිළිබඳව සාකච්ඡා කර, ඔවුන් දෙදෙනාම ඔම්බුඩ්ස්මන්වරයා හමුවට පැමිණ පැමිණිල්ල සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව, ඔහුගේ උපදෙස් හා මගපෙන්වීම ලබා ගනියි.

එය ඉතා වැදගත් හමුවක් වන අතර, එම අවස්ථාවේදී ඔම්බුඩ්ස්මන්වරයා විසින්, ලැබී ඇති පැමිණිල්ලේ අන්තර්ගත කරුණු සහ එම පැමිණිල්ල සමග අමුණා ඇති අනෙකුත් ලේඛන ද සමඟ සුපරික්ෂාකාරීව සලකා බලනු ලැබේ. පළමුව සහ ප්‍රධාන වශයෙන් පරික්ෂා කළ යුතු වන්නේ පැමිණිල්ල/චෝදනාව ඔම්බුඩ්ස්මන්වරයාගේ බල සීමාව ඇතුලතට වැටෙන්නේ ද යන්න නිශ්චය කිරීමයි. මෙම කරුණ තීරණය කිරීමේදී ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ (මෙහි මින් මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) 10, 11 සහ 17 යන වගන්තිවල අන්තර්ගත කරුණු වෙතද සිය අවධානය යොමු කරනු ලබයි. එවනු ලබන පැමිණිල්ල පනතේ විෂය පථය තුලට නොගැනෙන්නේ නම්, එම කරුණ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වමින් පැමිණිලිකරු වෙත ඒ පිළිබඳව වහාම දැනුම් දෙනු ලැබේ.

ඔම්බුඩ්ස්මන්වරයා විසින් අදාල ඉල්ලීමේ ඉදිරි කටයුතු සිදුකරගෙන යාමට තීරණය කරන අවස්ථාවේදී එක් එක් පැමිණිල්ල සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව ඔහු විසින් සුදුසු යැයි නිගමනය කරනු ලබන නියෝගයන් කරනු ලැබේ. අපේක්ෂිත සහනය සහ පැමිණිල්ල කරනු ලබන්නේ කුමන අයෙකුට එරෙහිව ද ආදී කරුණු පිළිබඳව වැඩිදුර තොරතුරු අවශ්‍ය

බවට ඔම්බුඩ්ස්මන්වරයාට හැඟේ නම්, එම තොරතුරු පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ඉන්පසු පනතෙහි විධිවිධාන වලට අනුකූලව එම කරුණ විමර්ශනය කොට අවසන් කිරීමට සෑම උත්සාහයක්ම දරනු ලබන අතර, එම කටයුත්ත නිරන්තරයෙන්ම පැමිණිල්ලේ ස්වභාවය මත රඳා පවතී.

අදාල කරුණ පිළිබඳ විමර්ශන කටයුතු ඉදිරියට සිදුකරගෙන යාමට ඒ ඒ අවස්ථානුකූලව තීරණය කරන අවස්ථාවක, බොහෝවිට නිරීක්ෂණ කැඳවනු ලබන්නේ චෝදනාවට ලක්ව ඇති අයට වඩා ඉහල මට්ටමකට අයත් නිලධාරීන්ගෙනි. නිරීක්ෂණ කැඳවීමේ එම ලිපි ඔම්බුඩ්ස්මන්වරයා වෙත ලද විගසම, පැමිණිලිකරු ඉල්ලා ඇති සහන සැලසීම සඳහා අදාල බලධාරීන් විසින් පියවර ගෙන ඇති බොහෝ අවස්ථාවන් ද ඇත. එහෙත්, අදාල ගැටලුව සම්බන්ධයෙන් නිලධාරීන්ගෙන් නිරීක්ෂණ ලබා ගැනීම සඳහා සිහි කැඳවීම් යැවීමට ද මෙම කාර්යාලයට සිදු වූ අවස්ථා ද නැත්තේම නොවේ. ලිපි කිහිපයක් හුවමාරු වීමෙන් පසුව ඔම්බුඩ්ස්මන්වරයාට අර්ථාන්විත ප්‍රතිඵල දැක ගැනීමට ලැබුණු අවස්ථාවන් ද සෑහෙන සංඛ්‍යාවක් විය. ඔම්බුඩ්ස්මන්වරයා හට පිළිගත හැකි තීරණයකට එළඹීමට නොහැකි අවස්ථාවන්හිදී පරීක්ෂණයක් පැවැත්වීම සඳහා, අදාල පාර්ශවයන් මෙම කාර්යාලය වෙත කැඳවනු ලබයි.

මෙම පරීක්ෂණය පැවැත්වෙනුයේ, සෑම පාර්ශවයක් සඳහාම තමාට අදාල කරුණු එකිනෙකා ඉදිරියේ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙමින් ස්වභාවික යුක්තියේ රීතීන් පිළිපදිමිනි. පෙර සඳහන් කළ පරිදි, මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය වීමක් හෝ වෙනත් අයුක්තියක් ඔප්පු වූ ඕනෑම විටක, ඔම්බුඩ්ස්මන්වරයා විසින් වින්දිතයා හට සහන සැලසීම සඳහා සෑම උත්සාහයක්ම දරනු ලැබේ. එබඳු ක්‍රියාමාර්ගයක් තුලින් පිළිගත හැකි විසඳුමකට එළඹීමට අපොහොසත් වුවහොත්, අදාල කරුණ විසඳීම සඳහා වැඩිදුරටත් පරීක්ෂණ පැවැත්වීමට නියම කරනු ලැබේ. ඔම්බුඩ්ස්මන්වරයාගේ එම සියලු උත්සාහයන් අසාර්ථක වුවහොත්, ඔහු එම ගැටලුව පිළිබඳව තීන්දුවක් ගෙන, ඒ අනුව සුදුසු නිර්දේශ ඉදිරිපත් කරමින්, එය වගඋත්තරකාර පාර්ශ්වය වෙත දැනුම් දෙන අතර, දී ඇති කාල සීමාවක් තුල එම තීන්දුව ක්‍රියාත්මක කරන ලෙස ද දැනුම් දෙනු ලැබේ. එසේ නිශ්චිතව ලබා දුන් කාල සීමාව තුලදී කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැතිනම් ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඔහුගේ වාර්තාවේ පිටපතක්, සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අතිගරු ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව වෙත යොමු කරනු ලැබේ. ඉහත සඳහන් ක්‍රියාදාමය අනුගමනය කිරීමේදී ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ නිලධාරීන් සෑම විටම එම කරුණ සම්බන්ධව රහස්‍යභාවය ඉතාමත් ඉහල මට්ටමකින් පවත්වාගෙන යනු ලබන බව මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුය.

ඉල්ලුම්පත්‍ර සැකසීමේ ක්‍රමවේදය සහ ඉන්පසු ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් කිරීමෙන් අනතුරුව, ඔම්බුඩ්ස්මන්වරයාගේ මැදිහත්වීම අපේක්ෂා කළ ඉල්ලුම්කරුවන් සඳහා මෙම කාර්යාලය මගින් විවිධ ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සලසන ලද සහන සම්බන්ධ කරුණු කිහිපයක් වෙත අවධානය යොමු කිරීමට අදහස් කරමි. එය මෙම කාර්යාලය වෙත සිදු කරන

ඉල්ලීම්වල ආකාරය සහ එහි ස්වභාවය පිළිබඳව, නියමාකාරයෙන් අවබෝධ කර ගැනීමට උපකාරී වනු ඇත.

**අංකය : OMB/P/2/1/162** **නම : ඩබ්.එච්.පුන්‍යදාස මයා**

පැමිණිලිකරු වන ඩබ්.එච්.පුන්‍යදාස මහතා සිය පවුලේ වැඩිමහල් පිරිමි දරුවා වන අතර, තම පියාට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් හිමි වූ අංක අ.භූ.වී.73/4 හි 2776 දරණ වාරි ඉඩම් කැබැල්ල ඔහු භුක්ති විදිනු ලබයි. නමුත් එහි පසු අයිතිය ඔහුගේ සහෝදරිය වන ඩබ්.එච්.මානෙල් ප්‍රියන්ති යන අයව පියා විසින් නම් කර ඇත. එබැවින්, එහි අයිතිය ඔහුට ලබාගැනීමට අවුරුදු 26 තිස්සේ කටයුතු කළද, ඔහුට එම අයිතිය නොලැබීම සම්බන්ධයෙන් අප වෙත පැමිණිලි කරන ලදි.

ඒ අනුව, අප විසින් ඒ සැබැඳිව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් වාර්තා කැඳවන ලදි. ඊට ලද පිළිතුරු වාර්තාවෙහි සඳහන්ව ඇත්තේ, ගැටළුවට ප්‍රස්තුත වාරි ඉඩම අංක අ.භූ.වී.73/4 හි කැබලි අංක 2776 වන, හෙක්ටයාර් 1.276ක වාරි ඉඩම බවත්, ඒ සඳහා නිකුත් කර ඇති මො/උව/ප්‍ර/බ/54 දරණ අවසර පත්‍රයේ පසු උරුමක්කරු ලෙස, කට්ටිකරුගේ දියණිය වන වේවැල්වල හෙට්ටිගේ මානෙල් ප්‍රියන්ති යන අයව නම් කර ඇති බවත්, ඉල්ලුම්කරු බලහත්කාරයෙන් ඉඩම සංවර්ධනය කර භුක්ති විදි බවත්ය. එම කරුණු සලකා බැලීමෙන් අනතුරුව, පැමිණිලිකරුගේ දීර්ඝ කාලීන භුක්තිය සළකාබලා, අදාල වාරි ඉඩම ඉල්ලුම්කරු වන ඩබ්.එච්.පුන්‍යදාස යන අය වෙත ලබාදීමට හැකියාවක් ඇත්ද යන්න ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් විමසන ලදි. එවිට දන්වා සිටින ලද්දේ ඩබ්.එච්.මානෙල් ප්‍රියන්ති යන අයගේ කැමැත්ත ඒ සඳහා අවශ්‍ය නිසා ඇයව පරීක්ෂණයක් සඳහා කැඳවා ඇති නමුත්, ඇය ඉදිරිපත් වී නොමැති බවයි.

පසුව ඩබ්.එච්.මානෙල් ප්‍රියන්ති යන අයගේ ලිපිනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතින් ලබාගෙන අදාල වාරි ඉඩම ඩබ්.එච්.පුන්‍යදාස වෙත ලබා දීමට එකඟවන්නේද යන්න අප ආයතනය විසින් ඇයගෙන් විමසන ලදි. ඇයගේ අදහස වූයේ වර්තමාන වෙළඳපොලේ පවතින ඉඩම් වල මිල තක්සේරුවට සරිලන මුදලක් ඇයට ලබාදෙන්නේ නම් ඉඩමේ අයිතිය පවරා දීමට කැමති බවයි. ඒ බව අප ආයතනය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට දන්වා ඩබ්.එච්.පුන්‍යදාස මහතා වෙත ලබාදිය හැකි සහනයක් පිළිබඳ විමසීමෙන් පසු මහවැලි අධිකාරිය විසින් දන්වා සිටියේ, මහවැලි අධිකාරියේ ඉඩම් අංශය විසින් පාර්ශවකරුවන් කැඳවා පරීක්ෂණයක් සිදු කර අදාල වාරි ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග වලින් පසුව අවසන් තීරණයට එළඹීමට කටයුතු කරන බවයි. ඉල්ලුම්කරු වෙත ද ඒ බව දන්වා යැවීමෙන් පසු ඔහු විසින් 2020.11.27 දිනැතිව එවන ලද ලිපිය මගින් දන්වා ඇත්තේ,අප ආයතනයේ මැදිහත්වීම මත වසර 26ක් තිස්සේ දුක්විඳි ගැටලුවක් විසඳාගැනීමට හැකි වූ බවත්, ඒ සම්බන්ධයෙන් හදවතින්ම ස්තූති කරනු ලබන බවත්ය.

**අංකය : OMB/P/2/4/4628** **නම : ඩී.එම්.එන්.ඒ.දිසානායක මිය**

ඩී.එම්.එන්.ඒ.දිසානායක නැමති ඉල්ලුම්කාරිය 1993 වසරේ ඖෂධවේදී තනතුරට පත්වීමක් ලබා 2015.07.29 දක්වා මාතලේ දිස්ත්‍රික් මහ රෝහලේ සේවය කර ඇත. එසේ සේවය කරමින් සිටියදී, 2014.09.27 දින ඇය ඖෂධවේදී විශේෂ ශ්‍රේණියට උසස් වී ඇත. නමුත් ඇය සමඟ එම උසස්වීම ලැබූ නිලධාරීන් තිදෙනෙකුගේ උසස්වීම 2013.01.01 දිනට පෙරදාතම් කර ඇතත්, සිය උසස්වීම පෙරදාතම් කර නොමැති බවත්, තමන්ට පසුව විශේෂ ශ්‍රේණි උසස්වීම් ලබාගත් නිලධාරීන් දෙදෙනෙකුට එම උසස්වීම් 2013.01.01 දිනට පෙරදාතම් කර ලබාදීමෙන්, තමාට අසාධාරණයක් සිදු වී ඇති බවටත්, පවසමින් ඇයගේ උසස්වීම ද 2013.01.01 දිනට පෙරදාතම් කර දෙන ලෙස ඉල්ලමින් උක්ත ඉල්ලුම්කාරිය අප වෙත පැමිණිලි කර ඇත.

ඒඅනුව, මෙම ගැටළුව සම්බන්ධයෙන් මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් වාර්තා කැඳවන ලදි. එහිදී අනාවරණය වූයේ මධ්‍යම පළාත සඳහා පළමුව 2013.05.20 දිනැතිව ඖෂධවේදී විශේෂ ශ්‍රේණි තනතුරු 03ක් අනුමත වී ඇති බවත්, ඒ සඳහා ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත වැඩිම ලකුණු ලබාගත් නිලධාරීන් තිදෙනෙකු 2014.08.15 දිනැතිව පත්කර ඇති බවත්ය. එම එක් නිලධාරියෙකු විශ්‍රාම යෑම හේතුවෙන් ජ්‍යෙෂ්ඨතා ලකුණු ලේඛනයේ 04 ස්ථානයේ පසු වී ඇති ඉල්ලුම්කාරියට 2014.09.27 දින සිට ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ පත්වීම ලබා දී ඇති බවත්ය. එසේ තිබියදී 2015.08.05 දිනැතිව දෙවන වරටත් මධ්‍යම පළාත සඳහා ඖෂධවේදී විශේෂ ශ්‍රේණියේ තනතුරු 02ක් අනුමත වී ඇත්තේ, 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වීම හේතුවෙන්, මුල් අවස්ථාවේදී විශේෂ ශ්‍රේණි පත්වීම් ලද තිදෙනාගේ පත්වීම් ඔවුන්ගේ ඉල්ලීමකින් තොරවම, 2013.01.01 දිනට පෙරදාතම් කර ලබා දී ඇත. එම තත්ත්වය මත ඉල්ලුම්කාරියගේ පත්වීමද 2013.01.01 දිනට පෙරදාතම් කළ යුතුව තිබුණද, එය සිදු කර නොමැති අතර, ඉල්ලුම්කාරියට පසුව විශේෂ ශ්‍රේණි උසස්වීම ලබාදුන් නිලධාරීන් දෙදෙනෙකුගේ පත්වීමද 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී ඇත. ඒ අනුව ඉල්ලුම්කාරියට වඩා ජ්‍යෙෂ්ඨතාවයෙන් හා කුසලතාවයෙන් අඩු නිලධාරීන් දෙදෙනෙකුට 2013.01.01 දින සිට විශේෂ ශ්‍රේණිය ලබා දෙමින්, ඉල්ලුම්කාරියට එසේ ලබා නොදීමත් මත ඇයට විශාල අසාධාරණයක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

ඒ අනුව අදාළ කරුණු, මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත පැහැදිලි කිරීමෙන් අනතුරුව එම දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගනිමින් ඉල්ලුම්කාරියට හිමිවිය යුතු වූ ඖෂධවේදී විශේෂ ශ්‍රේණි උසස්වීම 2013.01.01 දිනට පෙරදාතම් කිරිමට කටයුතු කිරීමෙන් ගැටළුව නිරාකරණය කරන ලදි. ඒ අනුව ඉල්ලුම්කාරිය අදාළ ආයතන වෙතින් ඉල්ලීම් ගණනාවක් සිදු කිරීමෙන් අනතුරුව ද ඉටු නොවූ ඉල්ලීමක්, අප ආයතනයේ මැදිහත්වීම මත නිරාකරණය වී ඇත.

**අංකය : OMB/P/2/4/4414** **නම : එස්.එන්.සී.දයාරත්න මිය**

එස්.එන්.සී.දයාරත්න නැමති ඉල්ලුම්කාරිය 2015.12.18 දිනැති ගැසට් නිවේදනය අනුව අධ්‍යාපන පරිපාලන සේවයේ III පන්තියට සීමිත පදනම මත බඳවා ගැනීමේ විභාගයට ඉල්ලුම් කර ඉන් සමත් වී ඇත. ඉන් අනතුරුව තනතුර සඳහා තෝරා ගැනීමට පවත්වා ඇති වාචික පරීක්ෂණයට ද ඉදිරිපත් වී ඇතත්, ඇයගේ උපාධියෙහි ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය විෂයට අදාළව 1/3 ක විෂය සංකලනයක් නොමැති බව දක්වා ඇයට පත්වීම ලබා දී නොමැති බවට දක්වමින් අප වෙත පැමිණිලි කර ඇති අතර, මූලික සුදුසුකම් සපුරා ඇති තමාට අදාළ පත්වීම ලබාදෙන ලෙස ඇය විසින් ඉල්ලා ඇත.

ඒ අනුව, මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙතින් වාර්තා කැඳවීමෙන් අනතුරුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා අධ්‍යාපන සේවා කමිටුවෙහි අදාළ බලධාරීන්ගේ සහභාගීත්වයෙන් පරීක්ෂණයක් ද පවත්වන ලදි. එහිදී අනාවරණය වූ කරුණු අනුව පෙනී යන ලද්දේ, ඉල්ලුම්කාරිය සතු උපාධියෙහි විෂය සංකලනය තුළ ශිෂ්‍ය උපදේශනය හා මාර්ගෝපදේශනය විෂයට අදාළව 1/3 ක විෂය සංකලනයක් තිබෙන බව අදාළ විශ්ව විද්‍යාලය මඟින් සනාථ කරන්නේ නම් පත්වීම ලබාදිය හැකි බවයි. ඒ අනුව, අප ආයතනය විසින් කොළඹ විශ්ව විද්‍යාලය වෙත ඒ බව දැන්වීමෙන් පසු ඔවුන් විසින් අදාළ සනාථ කිරීම සිදුකළ අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් ඉල්ලුම්කාරිය වෙත අධ්‍යාපන පරිපාලන සේවයේ පත්වීමක් ලබාදීමට කටයුතු කරන ලදි.

ඒ අනුව සුදුසුකම් සියල්ල සපුරා තිබියදී පත්වීමක් නොලැබීමට ගිය ඉල්ලුම්කාරියට මෙම ආයතනයේ මැදිහත්වීම මත අදාළ පත්වීම ලබාගැනීමට හැකි වී ඇත.

**අංකය : OMB/P/2/5/3347** **නම : ටී.ඒ.පී.කරුණාරත්න මයා**

ගොකරැල්ල, බලවත්තල, 105/1 ලිපිනයෙහි පදිංචි ටී.ඒ.පී.කරුණාරත්න යන අය විසින් ස්ථාන මාරුවීමක් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් 2020.03.02 දිනැතිව පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදි. ඔහුගේ ගැටළුව වූයේ ඔහු 2014.05.05 දින සිට 357, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයෙහි වන වෛද්‍ය සැපයීම් අංශයේ සේවය කරමින් සිටියදී, කුරුණෑගල ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශයේ පුරප්පාඩුවක් සඳහා 2018.04.12 දින අයදුම් කිරීමෙන් අනතුරුව, වයඹ පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය සඳහා වයඹ පළාත් රාජ්‍ය සේවයට මුදා හැරීමට අවශ්‍ය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලැබී තිබියදීත්, ඖෂධවේදීයකුගෙන් සිදු වූ වරදක් ඉල්ලුම්කරු මත පවරමින්, ඔහුව වයඹ පළාත් රාජ්‍ය සේවයට මුදාහැරීම ප්‍රතික්ෂේප කර ඇති බවයි. මේ සබැඳිව වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ වෙතින් විමසීමෙන් අනතුරුව, නිලධාරියා මුදාහැරීම සඳහා ඔහුව වගකීමෙන් නිදහස් කිරීමේ කටයුතු අවසන් කර ඇතත්, ඒ වන විට මැතිවරණයක් ප්‍රකාශයට පත්කර ඇති බැවින්, මැතිවරණය අවසන් වූ විගස

ඉල්ලුම්කරුව වයඹ පළාත් රාජ්‍ය සේවයට මුදාහැරිමට අවශ්‍ය කටයුතු සිදුකරන බවට දන්වා ඇත. ඒ බව ඉල්ලුම්කරු වෙත දැනුම් දී වයඹ පළාත් රාජ්‍ය සේවයට මුදා හැරීමෙන් පසුව දැනුවත් කරන ලෙස දන්වන ලදී. අනතුරුව, ඉල්ලුම්කරු විසින් 2020.09.09 දිනැතිව අප ආයතනය වෙත යොමු කරන ලද ලිපිය මඟින් දන්වා ඇත්තේ, අප ආයතනයේ මැදිහත්වීම හේතුවෙන් ඔහුව වයඹ පළාත් රාජ්‍ය සේවයට මුදා හැරිය බවත්, ඔහුගේ ගැටළුව අප කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් ලද ප්‍රතිඵලය, අද නිහතමානීව භුක්ති විඳින බවත්ය.

**අංකය : OMB/P/2/6/2490** **නම : කේ.ඒ.විමලාවතී මිය**

පැමිණිලිකාරිය වන කේ.ඒ.විමලාවතී මහත්මිය විසින් 2014.10.10 දිනැතිව එවන ලද පැමිණිල්ලේ කරුණු පහත පරිදි වේ. අනුව ඇයගේ නීත්‍යානුකූල විවාහක සැමියා වන එම්.ඩී.පීටර් යන අය සමඟ 1960 වසරේ දී විවාහ වී සිටියදී 1980 වර්ෂයේ සිට වසර 07ක පමණ කාලයක් සැමියා අතුරුදන්ව සිට ඇත. මෙම විවාහයෙන් ලද දරුවන් 06 දෙනෙකු තමාට තනිව නඩත්තු කිරීමට සිදුවීම හේතුවෙන් පීටර් මහතා මියගොස් ඇතැයි යන විශ්වාසය මත, විජේසිරි ධර්මරත්න යන අයෙකු සමඟ 1990 වර්ෂයේදී විවාහ වී ඇත. ඉන් වසර 4කට පමණ පසුව 1994 වර්ෂයේදී, පළමු විවාහක සැමියා රෝගාතුර වී විවාහක බිරිඳ සොයා පැමිණ ඇත. එසේ වීම හේතුවෙන් පසු දෙවන විවාහක සැමියා ඇය හැර ගොස් ඇත. ඇය නැවත පළමු සැමියා සමග ජීවත් වී ඇති අතර, ඊට වසර කිහිපයකට පසුව එම්.ඩී.පීටර් වන ඇයගේ පළමු සැමියා 1997 වර්ෂයේදී මියගොස් ඇත. එම වියෝවෙන් පසුව ඔහුගේ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ඇය විසින් ලබාගෙන ඇත. කෙසේ වෙතත්, පළමු විවාහක සැමියා ජීවතුන් අතර සිටියදී වෙනත් පුද්ගලයෙකු සමඟ විවාහයක් සිදුකර ගැනීමේ චෝදනාව මත 2009 වර්ෂයේ සිට අයගේ විශ්‍රාම වැටුප අත්හිටුවා ඇත. ධර්මසිරි මහතා සමග පසුව ඇති කරගත් විවාහය, 2012 වර්ෂයේ දී රත්නපුර දිසා අධිකරණයේ දික්කසාද නඩු තීන්දුවකට අනුව, ශූන්‍ය හා බල රහිත විවාහයක් බවට උසාවිය මඟින් තීන්දුවක් ලබා දී තිබියදීත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප පැමිණිලිකාරිය වෙත ලබාදීමට කටයුතු කර නොමැති බව වැඩිදුරටත් පැමිණිල්ලේ සහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් වාර්තාවක් කැඳවීමේදී දන්වා ඇත්තේ, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 31 (1) (1) වගන්තිය ප්‍රකාරව පැමිණිලිකරු වෙත විශ්‍රාම වැටුප ලබාදිය නොහැකි බවයි. පසුව නැවතත් අප ආයතනය විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කරමින් දන්වන ලද්දේ, රත්නපුර දිසා අධිකරණය මඟින් ධර්මරත්න මහතා සමඟ පැවති විවාහය මුල සිටම ශූන්‍ය හා බල රහිත විවාහයක් බවට තීන්දු කර ඇති බැවින්, ඇය වෙත විශ්‍රාම වැටුප ලබා ගැනීමේ අයිතිය ඇති බැවින් එය ලබාදීමට අවශ්‍ය කටයුතු කර දෙන ලෙසයි.

ඉන්පසු අපගේ මැදිහත්වීම මත 2016 වර්ෂයේ ජනවාරි මස සිට එම විශ්‍රාම වැටුප පැමිණිලිකාරිය වෙත ලබා දී ඇත. නමුත් 2009 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් මස දක්වා වූ

හිඟ වැටුප් ලබාදීමට නොහැකි බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් දන්වා ඇත. පසුව 2016 වර්ෂයේ සිට දිර්ඝ ලිපි හුවමාරුවකින් අනතුරුවත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් එය සිදු නොකිරීම හේතුවෙන්, 2018 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙතට ඔහුගේ බලතල ක්‍රියාත්මක කරමින් අදාල ගෙවීම් සිදුකිරීමට අනුමැතිය ලබාදෙන ලෙස අප විසින් දන්වන ලදී. ඉන් පසුව 2018 සිට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අතර, ලිපි හුවමාරු කරමින් අදාල කාර්යයන් ඉටුකිරීමට ප්‍රමාද වී තිබීම හේතුවෙන් නැවත 2019.03.19 දිනැතිව අප ආයතනය විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙතින් විමසීමක් ද සිදු කල අතර, ඒ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් අප වෙත දන්වා ඇත්තේ 2009 වර්ෂයේ සිට 2016.01.06 දක්වා කාලයට අදාළ හිඟ වැටුප් ලබාදීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති බවයි. ඒ අනුව අදාල හිඟ වැටුප් ගෙවීමට 2020 නොවැම්බර් මාසයේදී කටයුතු කර ඇති බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත.

පැමිණිලිකරු විසින් අදාල විශ්‍රාම වැටුප හා හිඟ වැටුප් ලබදෙන ලෙස ඉල්ලා වසර ගණනාවක් නිලධාරීන් වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කලද ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් අදාල බලධාරීන් විසින් දක්වා නොතිබිණ. පැමිණිලිකාරිය විසින් තම විශ්‍රාම වැටුප ලබා ගැනීමට නොහැකි වීම දන්වමින් 2015 වර්ෂයේදී අප වෙත ඉදිරිපත් වීමෙන් පසුව 2016 වර්ෂයේ සිට නැවත වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප ලැබීමටත් 2009 සිට 2016 වර්ෂය දක්වා හිඟ වැන්දඹු විශ්‍රාම වැටුප් ලබාදීමට කටයුතු කිරීම සඳහා අප ආයතනය විසින් කටයුතු කර ඇත.

අංකය : **OMB/P/2/7/804** නම : ඒ.එම්.සේනානායක මයා

පැමිණිලිකරු වන ඒ.එම්.සේනානායක මහතා 2005.04.25 දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලබා ඇත. මහජන සෞඛ්‍ය ක්ෂේත්‍ර සහකාර නිලධාරී තනතුරේ සිට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ ශ්‍රේණියට අදාළව විශ්‍රාම වැටුප් හා හිඟ මුදල් ලබාදෙන ලෙසට 2020.03.06 දිනැතිව ඔහු විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් වාර්තා කැඳවීමෙන් අනතුරුව, 2008.01.01 දින සිට 2019.06.30 දින දක්වා හිඟ මුදල් 2020 ජූලි මස විශ්‍රාම වැටුප සමඟ පැමිණිලිකරු වෙත ගෙවීම් කර ඇති බව වාර්තා කර ඇත.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් 2020.06.01 දිනැතිව වාර්තා කැඳවීමෙන් අනතුරුව, මාස 02ක් වැනි කෙටි කාලයක් තුලදී වසර ගණනාවක් ප්‍රමාද වී තිබූ හිඟ විශ්‍රාම වැටුප් ලැබීම ඒ මහතාගේ සතුටට හේතුවක් විය. ඉතා වයෝවෘද්ධ වූ ඔහු, රාජ්‍ය සේවයට කැපවීමෙන් තම රාජකාරී ඉටු කිරීමෙන් ඔවුනට ලැබිය යුතු උසස්වීම් ලැබීමෙන් පසු, එයට අදාළව වැටුප් සංශෝධන නොගෙවීම් පිළිබඳව මහත් දුකට පත්ව කිසියම් බලාපොරොත්තු සහගතව අප වෙත පැමිණිලිකිරීමෙන් අනතුරුව ඉතා කෙටි කාලයක් තුලදී එම හිඟ වැටුප් ලැබීමෙන් පැමිණිලිකරු මහත් සතුටට පත්වී එය ස්තුති ලිපියක් මගින් අකුරු කර අප වෙත එවීමට තරම් කාරුණික විය.

**අංකය : OMB/P/2/7/414** **නම : කේ.ජී.බන්දුපේම මයා**

පැමිණිලිකරු වන කේ.ජී.බන්දුපේම මහතා ශ්‍රී ලංකා යුධ හමුදා වෛද්‍ය බලකායේ අවු. 22යි මාස 08යි දින 27 ක් සේවය කර, බළලත් නිලධාරි 1 නිලයෙන් 2007.12.14 විශ්‍රාම ලබා දී ඇත. පසුව ඒ මහතා නැවත 2013.02.29 වන දින සිට වැටුප් හා විශ්‍රාම වැටුප් පදනම මත සක්‍රිය සේවයට බැදී අවුරුදු 03 මාස 02 දින 09ක් සේවය කර, අවුරුදු 55 සම්පූර්ණ කිරීම මත 2016.05.07 දින සේවයෙන් ඉවත් වී ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව, රජයේ සේවකයින්ගේ 2015.12.31 දිනට තිබූ වැටුප 2016.01.01 දින සිට වැඩිකර ඇත. ඒ අනුව ත්‍රිවිධ හමුදා සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව සිදුකර ඇත. ඒ වන විට පැමිණිලිකරු වෙත වැටුප් වර්ධක දෙකක් ලබා දි තිබුණද කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව ඔහුට හිමිවිය යුතු වැටුප් වැඩිවීම ලබා දී නොමැති බවට පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ අධ්‍යක්ෂ - වැටුප් හා ලේඛන වෙතින් වාර්තා කැඳවීමේදී දන්වා ඇත්තේ, වැටුප් හා විශ්‍රාම වැටප් පදනම මත රාජකාරී කල අයවළුන් යුධ හමුදාවට අත්‍යාවශ්‍ය අවස්ථාවක ඔවුන් විසින් කරනු ලැබූ සේවය සැලකිල්ලට ගෙන ඔවුන්ද 03/2016 වැටුප් චක්‍රලේඛ අනුව වැටුප් සංශෝධනය කිරීම පිළිබඳව ඉදිරි උපදෙස් ලබාදෙන මෙන් ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇති බවයි. එයට අදාළව ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් විමසීම් කිරීමේදී දීර්ඝව ලිපි හුවමාරුවීමෙන් අනතුරුව අවසානයේ පැමිණිලිකරු විසින් ඉල්ලා ඇති විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම සම්බන්ධව නීතිපති උපදෙස් ලබාගෙන, කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව, ප්‍රතිශෝධනය කරන ලද විශ්රාම වැටුප පැමිණිලිකරු වෙත ලබාදිය හැකි බව දන්වා තිබුණි. එයට අදාළව ඉදිරි කටයුතු සිදුවීමෙන් අනතුරුව පැමිණිලිකරු අදාළ වැටුප් වැඩිවීම ලද බවට 2020.02.12 ස්තූති ලිපිය මගින් දන්වා තිබුණි.

පැමිණිලිකරු විසින් අදාළ වැටුප් වැඩිවීම ලබාදෙන ලෙසට 2017 වර්ෂයේ සිටම අදාළ බලධාරීන් වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත්, ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් දැක්වීමට එම බලධාරීන් අපොහොසත් වී ඇත. එසේ බලාපොරොත්තු කඩවූ පසු පැමිණිලිකරු අප ආයතනය වෙතින් එම ඉල්ලීම ඉටුකිරීමෙන් අනතුරුව, අවසානයේ සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට සමත් වී ඇත. තවද, එම ප්‍රතිඵලය භුක්ති විඳිනුයේ පැමිණිලිකරු පමණක් නොවේ. ඉහත චක්‍රලේඛය මත පැමිණිලිකරුත් සමඟ විශ්‍රාම ගිය බොහෝ පිරිසකට හා සේවයේ නිරතව සිටින බොහෝ පිරිසකට එම වැටුප් වැඩිවීම ලැබී තිබුණි. එම හේතුව මත එම පිරිසගේ සැලකිය යුතු ප්‍රමාණයකින් වැටුප් වැඩිවීමක්ද සිදු වී ඇත. එසේ විශාල පිරිසකට එම වැටුප් වැඩිවීම ලබා ගැනීමට අවස්ථාව උදාවූයේ බන්දුපේම මහතා විසින් අප වෙත කරන ලද පැමිණිල්ලෙහි අවසන් ප්‍රතිඵලය මතය.

**අංකය : OMB/P/2/9/833** **නම : එන්.ඒ.සඳමාලි ප්‍රියන්තිකා මෙය**

ඉල්ලුම්කාරිය වන එන්.ඒ.සඳමාලි ප්‍රියන්තිකා යන අය විසින් ඉදිරිපත් කළ පැමිණිල්ල වූයේ, අංක 427 පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ සිට, 440 නෙළුවත්තුඩුව වසමට ඇයගේ පදිංචිය මාරු කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛණ ග්‍රාම නිලධාරි වෙත භාර දී ඇතත්, එය භාර නොගැනීම හේතුවෙන්, ඇයට ජාතික හැඳුනුම්පත සකස් කර ගැනීමට නොහැකි වූ බවයි.

ඒ අනුව අප විසින් මේ සම්බන්ධයෙන් සීතාවක ප්‍රාදේශිය ලේකම් වෙතින් වාර්තා කැඳවන ලදී. එසේ වාර්තා කැඳවීමෙන් පසු, ප්‍රාදේශිය ලේකම විසින් මෙම කාර්යය සිදු කරන ලෙස උක්ත සඳහන් 440 නෙළුවත්තුඩුව වසමේ ග්‍රාම නිලධාරි වෙත දැනුම් දී ඇතත්, ඒ ආකාරයෙන් කටයුතු නොකිරීම මත ඉල්ලුම්කාරිය විසින් නැවත පෙර පදිංචි ස්ථානයටම පදිංචිය මාරු කරමින්, එම වසම හරහා ජාතික හැඳුනුම්පත ලබා ගැනීමට කටයුතු කර ඇත.

තව ද, ඉහත පරිදි කටයුතු නොකළ 440 නෙළුවත්තුඩුව ග්‍රාම නිලධාරිනිය සේවය කරන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයටම අනුයුක්තව, ඇයගේ ස්වාමි පුරුෂයාද පරිපාලන ග්‍රාම නිලධාරි (අධීක්ෂණ) ලෙස සේවය කරන බව තහවුරු වී ඇත. ඒ අනුව ඉදිරියේදී ජනතාවට පීඩාකාරි තත්ත්වයක් ඇති නොවීම සඳහා දිස්ත්‍රික් ලේකම් හරහා නෙළුවත්තුඩුව වසමේ එම ග්‍රාම නිලධාරිනිය, පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්තව ස්ථාන මාරු කර ඇති බව ද සීතාවක ප්‍රාදේශිය ලේකම් විසින් මා වෙත එවා ඇති වාර්තාවේ වැඩිදුරටත් දන්වා ඇත.

**අංකය : OMB/P/2/10/1601** **නම : එස්.සී.ලීලාරත්න මයා**

එස්.සී.ලීලාරත්න මහතා විසින් 2020.02.06 දිනැතිව මා වෙත යොමු කරන ලද පෙත්සම මගින් දන්වා ඇත්තේ, 2020 වර්ෂයේ 01 ශ්‍රේණියට ඔහුගේ දරුවා ර/ඇඹි/ජනාධිපති විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා, 'ආසන්න පදිංචි' ගණයෙන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ බවත්, එහිදී ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඔප්පුව සම්බන්ධයෙන් ලකුණු ලබා දී ඇති ආකාරය දෝෂ සහිත බවත් ය.

එම කරුණු සලකා බැලීමෙන් පසුව, මවිසින් මේ සම්බන්ධයෙන් ර/ඇඹි/ජනාධිපති විද්‍යාලයෙහි විදුහල්පති වෙතින් වාර්තාවක් කැඳවන ලද අතර, ඒ අනුව 2020.03.02 දිනැති වාර්තාවක් මගින් ඇඹි/ජනාධිපති විද්‍යාලයෙහි විදුහල්පති විසින් අප වෙත දන්වන ලද්දේ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් නිකුත් කර ඇති 2019.09.04 දිනැති ලිපියක පැමිණිලිකරු පදිංචි ඉඩමෙහි අවසරපත්‍රය, පැමිණිලිකරුගේ මවගේ නමින් සඳහන් වීම හේතුවෙන්, පදිංචිය සම්බන්ධයෙන් ලකුණු ලබා දීමේදී එම ලිපියේ සඳහන් කරුණු පදනම් කර ගෙන ලකුණු ලබා දුන් බවයි.

කෙසේ වෙතත්, පසුව එනම් 2019.10.09 දිනැතිව නැවත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පැමිණිලිකරු පදිංචි ඉඩමෙහි පදිංචිය, පැමිණිලිකරු දරණ බවට සඳහන් කරමින් ලිපියක් නිකුත් කර තිබූ නමුත්, අභියාචනා පරීක්ෂණයේදී අලුතින් ඉදිරිපත් කරන ලද ලිපි සඳහා

ලකුණු ලබා දී නොතිබූ බැවින්, පැමිණිලිකරුගේ දරුවා හට නැවත ලකුණු හිමි නොවූ බවත්, විදුහල්පති විසින් වැඩිදුරටත් අප වෙත දන්වන ලදී.

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා හට පාසලට ඇතුළත් වීම සඳහා ලකුණු ලබා ගැනීමට තිබූ අවස්ථාව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ප්‍රථමයෙන් ලබා දී ඇති 2019.09.04 දිනැති ලිපියෙහි සඳහන් කරුණු නිවැරදිව සඳහන් නොකිරීම මත අහිමි වී ඇති බව පැහැදිලි වූ බැවින්, ඒ සම්බන්ධයෙන් කරුණු සඳහන් කරමින් 2020.06.23 දිනැතිව අප විසින් අධ්‍යාපන ලේකම් වෙත ලිපියක් යොමු කරන ලදී.

ඒ අනුව එම ලිපියෙහි සඳහන් කරුණු පිළිබඳ සොයා බැලීමේදී, පැමිණිලිකරුගේ දරුවා හට අසාධාරණයක් සිදු වී ඇති බව පැහැදිලි වූ බවත්, එම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවා ර/ඇඹි/ජනාධිපති විද්‍යාලයේ 01 ශ්‍රේණිය සඳහා ඇතුළත් කිරීම අනුමත කර විදුහල්පති වෙත දන්වා යැවූ බවත්, 2020.09.03 දිනැති වාර්තාවක් මගින් අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් අප වෙත දන්වන ලදී.

ඉන් අනතුරුව, එස්.සී.ලීලාරත්න මහතා විසින් අප වෙත 2020.09.28 දිනැති ලිපියක් යොමු කරමින් දන්වන ලද්දේ, ඔහුගේ දරුවා ර/ඇඹි/ජනාධිපති විද්‍යාලයේ 01 ශ්‍රේණිය සඳහා 2020.09.09 දින ඇතුළත් කරගත් බවත්, ඒ පිළිබඳ අප ආයතනයට ස්තූතිවන්ත වන බවත් ය.

මෙම පැමිණිල්ල හා සමාන පැමිණිල්ලක් කේ.පී.ඩබ්.එස්.නිරෝෂණ මහතා විසින් 2020.02.024 දිනැතිව අප වෙත යොමු කරන ලදී. එම පැමිණිල්ලේ ඉදිරි කටයුතු ගොනු අංක OMB/P/2/10/1609 යටතේ පවත්වාගෙන යමින් ඉල්ලුම්කරුගේ දියණිය ර/ඇඹි/ජනාධිපති විද්‍යාලයේ පළමු ශ්‍රේණිය සඳහා අපගේ මැදිහත් වීම මත  ඇතුළත් කිරීමට හැකියාව ලැබුණි.

**අංකය : OMB/P/2/10/1326** **නම :ආර්.පී.ජේ.රන්කොත්ගේ මයා**

ආර්.පී.ජේ.රන්කොත්ගේ මහතා විසින් 2018.03.21 දිනැතිව මා වෙත යොමු කරන ලද පෙත්මසක් මගින් දන්වන ලද්දේ, ඔහු වර්ෂ 33කට ආසන්න කාලයක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කල බවත්, ශ්‍රවණාබාධයකින් සහ තවත් රෝගාබාධ වලින් පෙළීම හේතුවෙන්, ශ්‍රීලංගම තුළ '2016 අංක 01 හා/හෝ 2016 අංක 01 (i)' යන චක්‍රලේඛයන්හි කොන්දේසි ප්‍රකාරව, සිය කැමැත්තෙන් විශ්‍රාම ගැන්වීමේ පටිපාටියට අනුව 2016.10.14 වන දින විශ්‍රාම ගත් බවත් ය. එම විශ්‍රාම ගැනීමට අනුව, පැමිණිලිකරු හට රු.2,048,970/-ක වන්දි මුදලක් හිමි විය යුතු වුවද, පැමිණිලිකරු වෙත හිමි වී ඇත්තේ රු.1,862,700/-ක මුදලක් පමණක් බවත්, ඒ අනුව තවදුරටත් රු.186,270/-ක හිඟ මුදලක් හිමි විය යුතු බවත් වැඩිදුරටත් අප වෙත දන්වන ලදී.

එම කරුණු සලකා බැලීමෙන් පසුව, මවිසින් මෙ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙහි සාමාන්‍යාධිකාරී වෙතින් වාර්තා කැඳවන ලද අතර, ඒ අනුව 2018.07.09 සහ 2018.11.13 දිනැති වාර්තා මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) විසින් අප වෙත දන්වන

ලද්දේ, පැමිණිලිකරු ජර්මන් කාර්මික අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ලැබූ කාලයට අදාළව ලබාගත් සහතික පත්‍රය ඔහුගේ පුද්ගලික ලිපි ගොනුවට ලබා දී නොතිබීම හේතුවෙන් එම කාල සීමාව ඔහුගේ සේවා කාලය ඇතුළත් වී නොමැති බවත්, ඒ අනුව ඔහුගේ සේවා කාලය වසර 30ක් ලෙස ගණනය කර වන්දි ගෙවීම සිදු කල බවත් ය.

නමුත් මෙ සම්බන්ධයෙන් අදහස් දක්වමින් පැමිණිලිකරු විසින් අප වෙත දන්වන ලද්දේ, ඔහුගේ ජර්මන් කාර්මික අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ලැබූ කාලය සම්බන්ධයෙන් තොරතුරු පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුලත්ව ඇති අතර, වන්දි මුදල ගණනය කිරීමේදී ඔහුගේ සේවා කාලය වසර 30ක් සේ සලකා ගණනය කළද, පාරිතෝෂික මුදල් ගෙවීමේදී, පුහුණු කාලය ද ඇතුලත් කර මුළු සේවා කාලය වසර 33ක් සේ සලකා ගණනය කර ඇති බවයි.

ඒ අනුව මේ සම්බන්ධයෙන් නැවත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් කරුණු විමසීමේදී, 2019.03.29 දිනැති වාර්තාවක් මගින් අප වෙත දන්වන ලද්දේ, පැමිණිලිකරු විසින් ඔහුගේ පුහුණු කාලයට අදාළ සහතික පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ වන්දි මුදල් ඉල්ලුම් පත්‍රය යොමු කිරීමෙන් පසුව වන බවත්, එම හේතුවෙන් විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව පාරිතෝෂික මුදල් ගණනය කිරීමේදී පමණක් පුහුණු කාලය සේවා කාලය ලෙස සලකා ගණනය කිරීමට හේතු වී ඇති බවත් ය.

කෙසේ වූවද, ඉහත කරුණු සියල්ල සලකා බැලීමෙන් පසුව, පැමිණිලිකරු විසින් පුහුණුව ලබා ගැනීම සම්බන්ධයෙන් වූ සහතිකය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබියදීත්, එම ලේඛනය ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ පමණින් වන්දි මුදල් ගෙවීම සඳහා එම වර්ෂ 03 නොසළකා හැරීම සාධාරණ නොවන බවත්, එම පුහුණුව ලැබූ කාලසීමාව සැලකිල්ලට ගෙන පාරිතෝෂික මුදල පැමිණිලිකරු හට ලබා ගැනීමට අයිතිවාසිකම ඇත්නම්, එම කාල සීමාවටම අදාල වන්දි මුදල ඔහුට නොගෙවා සිටීමට නොහැකි බවත්, මාගේ 2019.06.04 දිනැති ලිපියක් මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන)- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත දන්වන ලදී.

ඉන් අනතුරුව, ආර්.පී.ජේ.රන්කොත්ගේ මහතා විසින් අප වෙත 2020.01.24 දිනැති ලිපියක් යොමු කරමින් අප වෙත දන්වන ලද්දේ, ඔහු වෙත ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් හිමි වීමට තිබූ හිඟ වන්දි මුදල ලබා ගැනීමට හැකි වූ බවත්, ඒ පිළිබඳ අප ආයතනයට ස්තූතිවන්ත වන බවත් ය.

**මෙම කාර්යාලය මැදිහත්වීම හේතුවෙන් සහන ලබාදී ඇති අයවලුන් විසින් ඒ සම්බන්ධයෙන් ස්තූතිය පළකර ඇති ලිපිවල පිටපත්ද මෙම වාර්තාවට ඇතුලත් වුවහොත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරිමේ කාර්ය සම්පූර්ණ වන බැවින්, එම ලිපි මෙම වාර්ෂික වාර්තාව අවසානයේ ඇමුණුමක් ලෙස සඳහන් කර ඇත.**